වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යාපන අධ්‍යක්ෂ/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු (I පන්තිය) සඳහා නිලධාරීන් පත්කිරීමට අදාළ ලකුණු පටිපාටිය

නිර්ණායක	ලකුණු ලබා දෙන ආකාරය	උපරිම ලකුණු
01. ජ්‍යෙෂ්ඨතාවය	ශ්‍රීලං.අ.ප.සේ. I ශ්‍රේණියට උසස් වූ දින සිට එක් වසරකට ලකුණු 03 බැගින් වසර 08ක් සඳහා (3x8) - උපරිම ලකුණු 24	30
01.1. වයඹ පළාත තුළ අධ්‍යාපන පරිපාලන සේවයේ සේවය කල කාලය සඳහා	වසරකට ලකුණු 01 බැගින් වසර 06ක් සඳහා (1x6) - උපරිම ලකුණු 06	
02. අධ්‍යාපන සුදුසුකම් (කාර්යක්ෂමතා කඩඉම්වලින් නිදහස් කිරීමට සලකා බලන ලද සුදුසුකම් හැර වෙනත් අධ්‍යාපන සුදුසුකම් පමණක් ඉහත ලකුණු දීම සඳහා බලනු ලබන අතර එක් සහතිකයකයට/ ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. තවද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාල/ආයතන වෙතින් හදාරා ඇති සේවා ව්‍යවස්ථාවේ සඳහන් වන හෝ අධ්‍යාපන ලේකම් විසින් තීරණය කරනු ලබන අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ අධ්‍යාපන සුදුසුකම් සඳහා පමණක් අදාළ ලකුණු ලබා දෙනු ලැබේ.)	2.1 දර්ශනශූරි (PhD) - ලකුණු 15 2.2 දර්ශනපති (M Phil) - ලකුණු 12 2.3 පශ්චාත් උපාධිය - ලකුණු 10 2.4 පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - ලකුණු 07 - උපරිම ලකුණු 15	15
03. ක්ෂේත්‍රයහි සේවා පළපුරුද්ද (අදාළ පත්වීම් බලධාරීන් විසින් නිකුත් කර ඇති විධිමත් පත්වීම්/ස්ථානමාරු ලිපි සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.)	3.1.විදුහල්පති/අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/කලාප අධ්‍යාපන (ශ්‍රී ලං.අ.ප.සේ. I ශ්‍රේණියේ තනතුරක එක් වසරක සේවා කාලයකට ලකුණු 04 බැගින් උපරිම වසර 05ක් සඳහා) 3.2.නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය කොමසාරිස්/විදුහල්පති (ශ්‍රී ලං.අ.ප.සේ. II ශ්‍රේණියේ තනතුරක එක් වසරක සේවා කාලයකට ලකුණු 2.5 බැගින් උපරිම වසර 08ක් සඳහා) 3.3. විදුහල්පති/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ/සහකාර කොමසාරිස් /නියෝජ්‍ය විදුහල්පති (ශ්‍රීලං.අ.ප.සේ. III ශ්‍රේණියේ තනතුරක එක් වසරක සේවා කාලයකට ලකුණු 02 බැගින් උපරිම වසර 10 ක් සඳහා) ❖ ඉහත තනතුරක/තනතුරු වල වැඩ බැලීම/රාජකාරී ඉටුකිරීම/රාජකාරී ආවරණය කිරීම සඳහා සිදු කර ඇති පත්වීම් ලකුණු ලබා දීමේදී සලකා බලනු නොලැබේ. (පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති 121) උපරිම ලකුණු 20	20
04. අධ්‍යාපනයට අදාළ පර්යේෂණ සහ ප්‍රකාශන	4.1 පර්යේෂණ - ලකුණු 2.5x2 (ප්‍රසිද්ධ පර්යේෂණ සාකච්ඡා මණ්ඩපයකට (Research Symposium)ඉදිරිපත් කරන ලද හෝ පර්යේෂණ සඟරාවක (Research Journal) පළ කරන ලද පර්යේෂණ වාර්තා සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ)	05

	4.2. ග්‍රන්ථ ලකුණු2.5 x2 (අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය මඟින් අනුමැතිය ලද තනි පුද්ගල කතෘ හිමිකාරිත්වයක් දරන ග්‍රන්ථ සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ) (පෙළපොත් හා ඒ ආශ්‍රිත පරිශීලන ග්‍රන්ථ සඳහා ලකුණු ලබාදෙනු නොලබන අතර, අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය මඟින් අනුමැතිය ලද තනි පුද්ගල කතෘ හිමිකාරිත්වයක් දරන ග්‍රන්ථ සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ) 4.3. අධ්‍යාපන ප්‍රකාශන සඳහා ලබාදෙන ලද වාර්තා හා ශාස්ත්‍රීය සංග්‍රහ එකකට -ලකුණු 2.5 x 2 -උපරිම ලකුණු 05 ❖ (ජාතික/ජාත්‍යනතර මට්ටමින් ඉදිරිපත් වූ ප්‍රකාශනයට ලබාදුන් ලිපියක්/වාර්තාවක්) ❖ (ජාතික/ජාත්‍යන්තර මට්ටමේ ප්‍රසිද්ධ පර්යේෂණ සාකච්ඡ මණ්ඩපයකට ((Research Symposium) ඉදිරිපත් කරන ලද වාර්තා සඳහා සහතිකයක් ලබා තිබීම)	
05. පරිගණක සාක්ෂරතාවය පිළිබඳ දැනුම	ප්‍රායෝගික පරීක්ෂණයක් මඟින් ඇගයීමට ලක් කරනු ලැබේ. - උපරිම ලකුණු 05	05
06. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය	ප්‍රායෝගික පරීක්ෂණයක් මඟින් සන්නිවේදන කුසලතාවය සලකා බලනු ලැබේ. - උපරිම ලකුණු 05	05
07. ඉදිරිපත් කිරීම (අධ්‍යාපන ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් තමා දක්වා ඇති දායකත්වය පදනම් කරගෙන කරනු ලබන ඉදිරිපත් කිරීම. ඒ සඳහා පරිගණක ආශ්‍රයෙන් (Power Point) හෝ වෙනත් සුදුසු මාධ්‍යයකින් විනාඩි 05ක වාචික ඉදිරිපත් කිරීමක් සිදු කළ යුතු අතර සිදු කරනු ලබන එම ඉදිරිපත් කිරීමට අදාළ දෘඪ පිටපත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ලබා දිය යුතු වේ.)	i. ප්‍රවේශය හා හැඳින්වීම - ලකුණු 02 ii. අන්තර්ගතය - ලකුණු 02 iii. කාල කළමනාකරණය - ලකුණු 02 iv. ඉදිරිපත් කිරීමේ විලාශය - ලකුණු 02 v. නිමාව හා නිගමනය - ලකුණු 02 උපරිම ලකුණු 10	10
08. සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලැබූ සමස්ථ කුසලතාවය	- උපරිම ලකුණු 10	10
මුළු ලකුණු		100